## Spring


Tulips blooming
Birds cooing
There sweet songs…
Foxes rushing
Bunnies fluffing
There tails for Spring
Eggs hatching
Birds scratching
There tails for Spring…
Painted eggs
Lying in the meadow
On the soft bed of grass
Boys playing
Girls swaying
And give themselves
a good laugh…
Pigs munching
Goats crunching
Just in time for Spring…

♦ **Ravindu Ranawaka**
4th Grade
Sycamore Elementary
Simi Valley, **CA,USA**

## සොඳුරු ළමා පාසැල් විය

පස්වසරක් සපිරුණු දා
පුංචි බැගෙ බරේ දමා
අම්මාගේ සුරතේ වෙළී
ගියා ගමේ විදු පියසට
යහළු යෙහෙළියන් සමගින්
පුංචි පුටුවෙ වාඩිවෙලා
අත්පොඩි තාලයට ගසා
ගී කීවා
පන්තියෙ සැම එකතුවෙලා
දුව පැන සෙල්ලම් කරලා
පුංචි රණ්ඩු ඇතිවුනාම
ටිකක් වෙලා තරහ වුණා

♦ ***පසන්තිමා ඉසුරුණි නුගහපොල***
***උසස් බාලිකා විදුහල***
***මහනුවර*** **Sri Lanka**




## World's first free lending library
## ලොව ප්‍රථම නිදහස් පුස්තකාලය

6 Sep 1852, The world's first free lending library opened in Manchester in the UK. The first public library was set up in Canterbury, Kent, five years earlier but charged a penny for admission and a penny for book loan. More than 20,000 factory workers contributed funds to set up the Manchester Free Library. In its first year, 77,232 books were borrowed - but it was not until Clerkenwell Library opened in East London 40 years later that readers could browse. Previously they had to consult a catalogue and ask for a book to be retrieved.

1852 සැප්තැම්බර් මස 6 වෙනි දින ලොව ප්‍රථම නොමිළේ පොත් දෙන පුස්තකාලය එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් නගරයේ විවෘත විය. ඊට වසර 6 කට පෙර කෙන්ට් ප්‍රාන්තයේ කැන්ටබරි නගරයේ මුල්ම මහජන පුස්තකාලය විවෘත වූ නමුත් එහි ඇතුල්වීමේ ගාස්තුව ලෙස පැන්සයක්ද, එක් පොතක් ලබාගන්නට පැන්සයක් ද අය කෙරිණ. මැන්චෙස්ටර් පුස්තකාලය පිහිටවීම පිණිස කර්මාන්ත ශාලා සේවකයෝ 20,000 කට වඩා මුදල් පරිත්‍යාග කළහ. මුල් අවුරුද්දේම පොත් 77,232 ක් පිටතට ගෙන යන ලදී. එහෙත් නැගෙණහිර ලන්ඩනයේ ක්ලාකන්වෙල්හි පුස්තකාලයක් විවෘත වූ පසුවය ජනතාවට පොත් පෙරලා බලන්නට අවස්ථාවක් ලැබුණේ. ඊට පෙර පුස්තකාලයේ ඇති පොත් සඳහන් කැටලොග් පොතක් පෙරලා අවශ්‍ය පොත් ඇණවුම් කළ යුතු වීය.

♦ ***Auntie Ramani*** (***රමණී නැන්දා***)

## කුරුල්ලෝ

පාට පාට කුරුල්ලෝ
හරි ලස්සන කුරුල්ලෝ
අපේ ගෙදර වත්ත උඩින්
පියඹා යන කුරුල්ලෝ

කැටපෝලෙන් විදිනවාට
ගල්කැටයෙන් ගසනවාට
අපිව දාල යන්න එපා
අපිට ඕන කුරුල්ලෝ

ගස් වැල්වල මල් පිපෙන්න
මල් පිපිලා ගොඩ හැදෙන්න
නුඹ නැතිදා බැරිවෙනවා
එහෙම නේද කුරුල්ලෝ
මේ ලොව ලස්සන කරන්න
ඔබ නැති දා මගක් ඇද්ද
ඔබ නැතිදා ලොවක් නැතිලු
රැකගමු අපි කුරුල්ලෝ

♦ ***උදාර පැතුම්***
මාතර සා/තෝමස් කුමරවිදුහල


ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

ලංකා බැංකුව
BANK OF CEYLON
ලන්ඩන් ශාඛාව

වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ
ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC ගිණුමක් අරඹන්න !**
*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.


ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගතකර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**


# භාරතීය නිදහසේ 60 වස් සැමරුමට
# බොලිවුඩ් වෙතින් සංගීත තිළිණයක්




**මා** කලක සිට වෙසෙන ලන්ඩන් නගරයේ ඉල්පර්ඩ් පෙදෙසේ මාවතක ඉන්දියානු CD, කැසට්, හා DVD විකුණන ජනප්‍රිය සංගීතහලක් වෙයි. එය පසුකර යනවිට එහි ගොඩවී අළුතින් ආ ගී තැටි මොනවා දැයි බැලීම මගේ සිරිත ය.

මා සොයන්නේ සහ මිළට ගන්නේ 1950, 60 දශකයන්හි ජනප්‍රිය වූ, මා ප්‍රිය කළ හින්දි චිත්‍රපට ගීතය. සමහර විටෙක ඒ පැරණි චිත්‍රපටය ගැන අයිතිකරුද මා සමග කතාකරයි. හැම විටම අප දෙදෙන කතා කළේ ඉංග්‍රීසියෙනි. දිනක් එසේ කතාබහ කරද්දී ඔහු හින්දි බසින් යමක් මගෙන් විචාළේය. මට එය නොතේරුනු බව දුටු ඔහු මා ඉන්දියානුවෙකු නොව න බව තේරුම් ගෙන මා කොයි රටෙන්දැයි ඇසුවේය. මා ලාංකිකයෙකු බව කීවෙමි. අපට හින්දි බස නොතේරුනත් ඒ කාලයේ සිටම හින්දි චිත්‍රපට සහ හින්දි සංගීතය අප රටේ ජනප්‍රිය බව මා ඔහුට කී විට, " ඔව්! ඔව්! ඒ කාලයේ මුළු ඉන්දියාවේම ජනප්‍රිය ගුවන් විදුලිය වුණේ රේඩියෝ සිලෝන්. 1950, 60 ගණන්වල කොළඹින් සමස්ථ ඉන්දියාවට සහ පකිස්ථානයට කෙටි තරංග වලින් ප්‍රචාරය කෙරුණු ආකාශ්වාහිනී පංචරංගී ප්‍රෝග්‍රෑම් එකට මුළු ඉන්දියාවම සවන් දුන්නා " ඔහු කීවේය. " අපි ඉන්දියාවෙ සිටිද්දී අළුත්ම බොලිවුඩ් චිත්‍රපට ගී ඉස්සෙල්ලාම අහන්නේ ඒ ප්‍රචාර යෙන්. දැන් මොනවා වෙලා ද? ලංකාවෙ ගුවන් විදුලි රූපවාහිනී ප්‍රචාර ගැන කිසි දෙයක් දැන් ඉන්දියාවෙ අය දන්නෙ නැහැ" යි ද ඔහු පැවසීය.

ටික දිනකට පෙර මා සංගීතහලට ගොඩවූ විට " ආ සහාබ්, අළුත්ම ඇල්බම් එකක් ඇවිත් තියෙනවා, ඔබ එයට ඉතාම කැමති වේවි " මා දුටු ගීත හල අයිතිකරු කීවේය. **60 Years of Bollywood** යයි නම්කරන ලද මේ ඉහළ දැක්වෙන එම ත්‍යාග ඇල්බමය මම මිළදී ගතිමි. එහි මිළ පවුම් 25 කි. එය ඉතා සිත් ඇදගන්නා සුළුය. ඉතා ශෝභමාන අයුරින් සකසා ඇත. භාරතයේ නිදහසට හැට වසර සම්පූර්ණවීම නිමිත්තෙන් නිකුත්කරන ලද මෙම එකතුවෙහි සංයුක්ත තැටි හතරකි. 1947 නිදහස ලැබූ වර්ෂයේ සිට හැට වසරක් සපිරුණු 2007 වසර දක්වා කාලය අතරතුර ඉන්දියාවේ නිශ්පාදනය වුණු චිත්‍රපට අතුරෙන් හොඳම සහ ජනප්‍රියම චිත්‍රපට ගීත 60 ක් තෝරාගෙන අනු පිළිවෙලට මෙහි අඩංගු කර තිබේ.

භාරතීය සංගීතය පිළිබඳ විශේෂඥයින්ගේ තේරීම යටතේ ඒ ඒ යුගයේ ලක්ෂණ පිළිබිඹු කරන එම ගී තැටි ඩිජිටල් ක්‍රමයෙන් පිරිසිදු කොට, නවීන ශබ්ද මාධූර්යයෙන් පණපොවා ඇත. ගීතවල නම්, ඊට අදාල චිත්‍රපටවල නම් හා ගැයූ ශිල්පියා හෝ ශිල්පිණියගේ නම් ද කවරයේ පැහැදිලිව ක්‍රමවත්ව දක්වා ඇත. මොහොමඩ් රෆී, මුකේෂ්, තලාත් මොහොමඩ්, ලතා මංගෙෂ්කාර්, ශම්ශාද් බෙගම්, ආශා බෝන්ස් ලේ, සුමන් කල්‍යාණපූර්, කිශෝර් කුමාර් ආදී පැරණි ශිල්පීන්ගේ සිට මෑත යුගයේ ජනප්‍රිය ගායන ශිල්පීන් වන උදිත් නාරායන්, කවිතා ක්‍රිෂ්ණමූර්ති, සුක්වින්දර් සිං, සප්නා ආවස්ති ආදීන්ගේ ගීත වලින් කෙළවර වෙයි. හින්දි චිත්‍රපට ගී රසිකයින්ට ඒ සුන්දර මතක මාවතේ 60 වසරක් ආපසු යමින් ගී රස වින්දනය ලැබීම පිණිසම මෙය නිශ්පාදනය කරන ලද බව මෙම අගනා සමරු ඇල්බමයේ සඳහන් වේ.

මෙම ගීත තැටිවල පළමුවැන්න සහ දෙවැන්න අසා සිටින විට අප යම් ප්‍රමාණයකට මතක මාවතේ ආපසු යැවෙයි. ඒ 1950 සහ 60 ගණන්වල අපේ ජනප්‍රිය සංගීතය ගොඩ නැගුණේ ඒ යුගයේ ඒ යුගයේ ජනප්‍රිය වූ හින්දි චිත්‍රපට ගීතවල තාල කොපිකොට සිංහල වචන දමා අප ගායක ගායිකාවන් ගැයූ ගීත වශයෙන් බැවිනි. මේවා අසා සිටින විට අප රටේ කලක්ම ජනප්‍රියව පැවති

සසර පරාදේ නැත පරමාදේ........
ඔය බැල්ම ඔය කැල්ම ........ මේ
රාත්‍රියේ චාන්දනී මා සොයා........
ගයා ගීතයන් ගමේ වෙල් එළියේ........
සිතුවෙ නෑ මං ලොවේ තාලේ........
අහෝ කුහකයි දනන් ලෝකේ........
සැනසිල්ල නැළවිල්ල මාගේ හිතේ......

ආදී ධර්මදාස වල්පොල, බෙග්, සිසිර, ජෝතිපාල, ලන්ත්‍රා, ලතා ආදී අප ගායක ගායිකාවන්ගේ ගැයුම් නිරායාසයෙන්ම මතකයට එයි.

නමුත් 1970 ගනන් පසුවන විට හින්දි කොපි කරනු වෙනුවට ක්‍රමයෙන් අපට අනන්‍ය වූ ජනප්‍රිය සංගීතයක් අප සංගීතඥයින් අතින් ගොඩනැගෙන් නට වීය. ස්වතන්ත්‍රවූ ඒ නිර්මාණයන් දේශීයත්වය හා සංස්කෘතික වටිනාකමෙන් ද අනූන වීය. අද අපි එම නව ප්‍රවේශයන්හි ඉදිරියට ගොස් තිබෙනු දැක්ම සතුටට කාරණයකි. දක්ෂ, නිර්මාණශීලී එමෙන්ම දේශීයත්වයට නැඹුරුවුණු තරුණ සංගීත ශිල්පීහු රැසක් අද අපේ භූමියේ සිටිති.

දැනට මාස දෙකකට පෙර අප රට ශ්‍රීලංකාව ද නිදහස ලබා 60 වන සංවත්සරය සැමරුවා ය. හමුදා පෙළපාලි සහිතව රජය සුපුරුදු පරිදි නිදහස් උත්සවය පැවැත්වීය. රටේ පවතින යුදමය තත්වය නිසා අවම මට්ටමකින් මෙය ඉටුකළ බව අපි දනිමු. ඒ දිනවල පුවත් පත් මාධ්‍ය ආදියෙන් ජනතාව මතක මාවතේ ආපසු ගෙනයන්නට ඇත. එයට පසු කාටත් එය අමතක වෙයි.

මෙම බොලිවුඩ් සංගීත තිළිණය දුටු වෙලේ අපට ද ජනතාව ඉදිරියට යොමුකර ලන එවන් පවතින දෙයක් හෝ දේවල් කළ නොහැකි ද යන්න මා සිතට නැගිණ. මේ බොලිවුඩ් තිළිණය මේ ලෙස සැකසුනේ බොලිවුඩ් චිත්‍රපට අද ලෝකයේ විශාල ලෙස පැතිරී කෝටි ගණනක ප්‍රේක්ෂක සමූහයකින් සමන්විත විශාලම ආයතනයක් බැවින්ද මෙවන් භාණ්ඩයකට අති විශාල වෙළඳ පොළක්ද ඇති නිසාය. අප කළ යුතුවන්නේ එවැනි වෙළඳ භාණ්ඩයක් නිශ්පාදනය කිරීම නොවේ.

අපේ සංගීතය, ගීත හා ගීත නාට්‍යය ආදිය පසුගිය හැට වසර තුළ හොඳ ඉදිරි ගමනක් පැමිණ තිබේ. 1970 ගණන්වල සිට අප සංගීතඥයින්ගේ සිනමා හා නාට්‍ය කලාකරුවන්ගේ ඉමහත් පරිශ්‍රමයේ ප්‍රථිඵල වශයෙන් අද අපට ආඩම්බර විය හැකි තත්වයකට ඒවා ගොඩ නැගී ඇත. මේවායෙන් වටිනා මිණිකැට විශේෂඥ මඬුල්ලක් මගින් තෝරා සීඩී, ඩීවීඩී ආදියෙන් සමන්විත මතු පවතිනා නිර්මාණ තිළිණයක් ගොඩනැගිය හැකිය. වාණිජ භාණ්ඩයකට වඩා රසවින්දනය හා නිර්මාණාත්මක පැත්ත එහි සාර්ථකත්වයේ මිම්ම විය යුතුය. එවැන්නක් අපේ අනාගත කලාකරුවන්, කලාකාරියන් ඉදිරියට තල්ලු කරලීමට ද දිරිදෙනු ඇත.

මේ මා සිතට ආ අදහසක් අනුව කරනු ලබන යෝජනාවක් පමණි. මෙය අප රටේ ළඟදීම සිදුවෙනවා ඇතැයි පතමු!

♦ ***වකුල ගුණපාල*** **Ilford Essex**


**Srilanka Information Site ශ්‍රී ලංකා තොරතුරු අඩවිය**
**www.srilankans.com**